මහකනදරා වැව සිනාසෙයි

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදය

08වැනි දිනය

● දිනේෂ් සමරකෝන්

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදයේ 08වැනි දිනය සඳහා වන විවාදය ඊයේ (30දා) පැවැත්වුණි. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වුණු අතර, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු මෙලෙස අදහස් පළ කළහ.

හිටපු ඇමති 'ස්පෙෂල් පාත්වේ' එක හරහා ගෙනාපු ඉමියුනොග්ලොබ්න් ඇතුළු ඖෂධ ලබාදුන් පුද්ගලයන් ගැන පසු විපරමක් කරන්න

සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රාජිත සේනාරත්න

ඖෂධවල තත්ත්වය පසුගිය දවස්වල මහා මංකොල්ලයක් බවට පත්වුණා. දිගින් දිගටම මේ WR එකට අලුත් අංගයක් දැම්මා. ... හිටපු ඇමතිවරයා. ඇමති හෝ අමාත්‍යාංශ යම්කිසි ඖෂධයක් ගන්න කිව්වාම NMRA එකේ ඉන්න CEO ඒක අනුමත කරනවා. හාල්, පරිප්පු, මුංඇට තෝරනවා වගේ තමයි මේ හරහා ඖෂධ තෝරන්න ගියේ. මම මාස 04කට කලින් කිව්වා මේ විදියට මේ වැඩපිළිවෙළ ගියොත් මේක අවසන් වෙන්නේ මහා ඛේදවාචකයකින් කියලා.

ඒ වගේම කියන්න ඕන ඉමියුනෝග්ලොබින් ඖෂධය පාවිච්චි කරපු අය අරගෙන ඒ පිළිබඳ ගණනයක් කරන්න ඕන ඒ අයගේ දැන් තත්ත්වය මොකක්ද කියලා. පසුවිපරමක් කරන්න. ඒ වගේම මේ ස්පෙෂල් පාත්වේ එකෙන් කොච්චර ඖෂධ අරන් තියෙනවාද, ඒවගේ ප්‍රතිවිපාක මොනවාද කියලා පසුවිපරමක් කරන්න. මොකද ඉස්සරහට මොනතරම් මරණ සහ ආබාධ ඇතිවෙයිද දන්නෙ නෑ. ඒ වගේම ශක්තිමත් NMRA එකක් හදන්න. අද පත්කරලා තියෙන සභාපති ඉතාම හොඳයි. අන්තිමට මේ ඖෂධ මංකොල්ලයෙන් අනුවෙලා තියෙන්නෙ ඖෂධ සැපයුම් අංශයේ කට්ටිය.

සෞඛ්‍ය අංශයේ පවතින අර්බුදයට හොඳම විසඳුම තමයි මෙරට තුළ ඖෂධ නිෂ්පාදනය කිරීම

සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ

වර්තමානයේ ලංකාවේ ඇතිවෙලා තියෙන අර්බුදයත් එක්ක ඖෂධ නියාමන අධිකාරියේ ගැටලු රාශියක් මතුවෙලා තියෙනවා. ලියාපදිංචිය වෙනුවෙන් අතිවිශාල ප්‍රමාණයක් ලැබිලා තියෙනවා. අපි දැනුම් ...

... වෛද්‍යවරුන් ... හෙදියන් විශාල ප්‍රමාණයක් රටින් බැහැර වෙන්න ඉල්ලලා තියෙනවා. අපිට අවශ්‍යයි ඔවුන්ට අවශ්‍ය සාධනීය වෘත්තිමය වටපිටාවක වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න. ඒ වෙනුවෙන් පසුගිය මාසයක කාලයක් තිස්සේ මේ වෘත්තීය සමිති සියල්ලම වගේ අපි සාකච්ඡා කළා. සෑම කෙනෙකුටම ලබාදෙන්න පුළුවන් සහනයන් අමාත්‍යාංශය පැත්තෙන් ලබාදෙන්න කටයුතු කරනවා.

මේ රටේ ටෙන්ඩර් ක්‍රමය සම්පූර්ණයෙන්ම දූෂිතයි, ඒක සම්පූර්ණයෙන්ම වෙනස් විය යුතුයි

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

ටෙන්ඩර් කැඳවීම සහ එහි ක්‍රියාකාරීත්වය මම කියන්නෙ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් විතරක් නෙවෙයි මේ රටේ ටෙන්ඩර් ක්‍රමය සම්පූර්ණයෙන්ම දූෂිතයි. වංචාව, දූෂණය, හොරකම ගැන කතා කරනකොට ටෙන්ඩර් ක්‍රමය සම්පූර්ණ දූෂිත ක්‍රමයක් බවට පත්වෙලා. ඒක සම්පූර්ණයෙන්ම වෙනස් විය යුතුයි. අනිත් පැත්තෙන් අපි ප්‍රධාන වශයෙන්ම කල්පනා කරන්න ඕන වංචා, දූෂණ නැති කරනවා වගේම සේවකයන්ගේ තියෙන දුක්ගැනවිල්ලක් වන මාරුවීම් ක්‍රමවේදය. විශේෂයෙන්ම පසුගිය කාලයේ මාරුවීම් මණ්ඩලවලදී යම් යම් ඇමතිවරුන්ගේ දැඩි බලපෑම් නිසා නීත්‍යානුකූලව අවුරුදුපතා හරියාකාරව කෙරීගෙන ...

ජනතාවට අඩු මිලට ඖෂධ මිලදී ගන්න රාජ්‍ය ඔසුසැල් අලුතින් පිහිටුවීමේ වැඩපිළිවෙළ නැවත ක්‍රියාත්මක කරන්න

පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චන්න ජයසුමන

ඖෂධ නියාමන අධිකාරිය 2015 පිහිටුවනු ලැබුවා. ඒ පනතේ ප්‍රබල අඩුපාඩු ගණනාවක් තියෙනවා. විශේෂයෙන් මේ පනතෙන් සුවඳ විලවුන් සහ ක්‍රීම් වර්ග නියාමනය සඳහා තිබුණු නීතිරීති සියල්ල බැහැර කරලා තිබුණා. ඒත් එක්කම යම් වරදක් කරලා අහු වුණාම දඬුවම් දීම සඳහා ලබාදීලා තිබුණු නීතිරීති ඉතාම දුර්වලයි. ඒ නිසා විද්වත් කමිටුවක් මගින් ඒ පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් නිර්මාණය කර ගත්තා. නීතිපතිවරයාගේ අනුමැතියත් ලැබිලා තියෙනවා ඒක අලුත් පනතක් ලෙස හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. නැතිනම් තිබුණු පනතේ සංශෝධනයක් ලෙස අප්‍රමාදීව ගේන්න.

රාජ්‍ය ඔසු සැල් සංඛ්‍යාව දැනට 50ක් විතර තියෙන්නේ. රට පුරා තවත් නගර 50ක ඔසු සැල් ව්‍යාප්ත කිරීම සඳහා තීරණයක් අරගෙන වැඩකටයුතු ඉදිරියට ගෙනාවා. ඒ දිනවල ඔසු සැලක් පටන් ගන්න විශාල වියදමක් තිබුණා. ඊට වඩා අඩු වියදමින් කරන්න ස්ථාන සොයලා වැඩපිළිවෙළක් සකස් කරලා තිබුණා. නමුත් පසුව ආපු සභාපතිවරයා ඒ කටයුත්තෙන් සම්පූර්ණයෙන් බැහැර වෙලා තිබුණා. ඒ නිසා මම සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපේ රටේ ජනතාවට අඩු මිලට හොඳ ඖෂධ ලබාගැනීම සඳහා ...

උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන්ට මෙන්ම පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ට නිසි තැන ලබාදීමට හැකියාව ලැබුණා

දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි

... ආයුර්වේද පනත ගේන ... බොහෝ අය ... කළා අපේ ... පාරම්පරික වෛද්‍ය ක්‍රම ... කරන්න යනවා ... අද වන විට ...

ආයුර්වේද පනත නැවත සංශෝධනය කරන්න

විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

... ප්‍රබුද්ධ, වඩාත් ප්‍රශස්ත විෂයමකට ප්‍රවේශ වන්න.

ඒ වගේම වෛද්‍ය සභාව පත් කිරීමේදී ගැටලු රැසක් ඉස්මතු වෙලා තියෙනවා. අවස්ථා ගණනාවකදී මේ හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයේ බොහොමයක් දෙනා ඇවිල්ලා අපිව හමුවෙලා අපිත් එක්ක සාකච්ඡා කළා. ඇත්තට මේ ප්‍රශ්නය ඉතාමත් සංකීර්ණයි. ඉතාමත්ම උග්‍රයි. ඒ කෙසේ වෙතත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා බොහොම කාරුණිකව මේ ප්‍රශ්නයට ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා, මේ හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයේ උද්ගතව තිබෙන අර්බුදකාරී තත්ත්වයට ඒ පාර්ශවකරුවන්ට සහනයක් ලැබෙන විදියට විසඳන්න කටයුතු කරන්න කියලා.

උතුරු නැගෙනහිර සාමාන්‍ය රෝහල් මූලික රෝහල් බවට පත්කරන බවට සඳහන් කළත්, ඒවා නමට පමණක් සීමා වෙලා.

දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී චාල්ස් නිර්මලනාදන්

දැනට තිබෙන සාමාන්‍ය රෝහල් මූලික රෝහල් බවට ශ්‍රේණිගත කරලා තියෙනවා. එලෙස ශ්‍රේණිගත කරලා තියෙන රෝහල් නමට පමණක් සීමා වෙලා තියෙනවා. එවා නාමපුවරුවට පමණක් ශ්‍රේණිගත වෙලා තියෙනවා. ඒ රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් නැහැ. පිරිස් බලය වෙන්න පුළුවන්, අනෙකුත් පහසුකම් වෙන්න පුළුවන්. ඇතැම් රෝහල් නම් වෙනස් කරලා අවුරුදු ගණනාවක් ...

තල් අරණෙන් නැගම් ගිය ගමන

● කලුතොට-මුහුකල පෝරියකෝ

දෘශ්‍යාබාධිත අය වෙනුවෙන් අපූරු උපාංග යුවළක් තැනූ පාසල් සිසුවෙක්



අද CARTOON



හොංකොං ඩිස්නිලන්තයේදී විවෘත කෙරුණු World of Frozen තේමා උද්‍යානය





... කෙරුණු මේ World of Frozen මාදිලියේ තේමා උද්‍යානයක් ලබන වසරේදී ටෝකියෝ ඩිස්නිලන්තයේදී විවෘත කිරීමටත්, 2025 වසරේදී පැරිස් නුවර ඩිස්නිලන්තයේදී විවෘත කිරීමටත් එම සමාගම බලාපොරොත්තුව සිටියි.

ඩිස්නිලන්තය වෙත ආදරය කරන බොහෝ දෙනා මෙලෙස Frozen චරිත සහ ස්ථාන ඇතුළත් තේමා උද්‍යානයක් පිළිබඳව දැඩි උනන්දුවකින් පසු වුණු බව සඳහන් වෙයි.

ඕනෑම අයෙකුට අවුකන පිළිමයට සිවුරු පෙරවිය හැකිද?

FEATURE විශේෂාංග

... පිළිමය යැයි මහාචාර්ය පරණවිතාන සූරීහු පවසති. ශිලාමය පද්ම පීඨයක නෙළා ඇති මෙම පිළිමයේ මුහුණ, බෙල්ල, පපු නාභිය, ලිංග නාභිය, කලවා, දණ කෙණ්ඩ, විළුඹ ලෙස එම නවාලය දැක්වෙයි. පිළිමයේ උස අඩි 38 අඟල් 10 කි. සිරස්පත සමග උස අඩි 46 අඟල් 4කි. අමරාවතී ...

කතරගම කිරි වෙහෙරේ දුටු පුවරුවක්

සිවුරු පෙරවූ අවුකන පිළිමය